
# අතිපූජනීය ගංගොඩවිල සෝම ස්වාමින්වහන්සේ හෙළ බොදු අප වෙනුවෙන් ලියූ අවසන් වදන් පෙළ



## සුපින්වත් මිනිසුනි

යමෙක් ඔබට හොඳ මිනිසෙක්යැයි කියයි නම් එසේ කියන්නේ ඔබ හිස කඳ කෙළින් තබාගෙන ඇවිදින්නෙක් නිසාම නොවේ. යහපත අයහපත වෙන්ව තෝරගෙන අයහපතින් වැළැකී යහපතෙහි යෙදීමට තරම් සුදුසු වූ මානසිකත්වයක් ඔබට ඇති බැවිනි.

එහෙත් සෑම මිනිසකුටම එතරම් පැහැදිලි මානසිකත්වයක් නැති බව අප දනිමු. ඔවුහු දුර්වල මානසිකත්වය ඇත්තෝය. එසේ වුවද ඔවුන්ගේ මනස උසස් කළ නොහැක්කේ නොවේ. උසස් කළ හැකි මනස් ඇති බැවින් "මනස්ස උස්සන්නතා" යනුවෙන් "මනුස්" යන්නෙහි අර්ථ විග්‍රහය දක්වා ඇත. මිනිසාට ආගම අවශ්‍ය වන්නේ ද ඔහු අයහපතින් වළකා යහපතෙහි යොදවා උසස් මානසිකත්වයක් ඇති මිනිසකු කිරමට මිස සිතීමේ ශක්තිය වළකා මන්ද බුද්ධිකයෙක් කිරමට නොවන බව ප්‍රතික්ශේප නොකරනු ඇතැයි සිතමි.

එබැවින් බුද්ධි ඇති මිනිසුනි සිතනු මැනවි. ඔබ ඔබේ යහපත ලෙස සලකන්නේ කුමක්දැයි සිතනු මැනවි. ඔබේ ඇස, කණ නාසය, දිව, ශරිරය පිනවමින් කාය චිත්ත පීඩාවකින් තොරව සැනසිල්ලේ ජීවත් වීමට ලැබීම හැර ඔබට මෙලෝ වශයෙන් ලැබිය හැකි යහපතක් තිබේද ?

ඔබ මෙන්ම අන් සියලු සත්වයන් ද එසේ සැපසේ යහපත්ව ජීවත්වීමට කැමති බව ඔබ විශ්වාස කරනු ඇතැයි මම තරයේ අදහමි. මේ පණිවුඩය එවන් විශ්වාසයක් තහවුරු කළ හැකි සත්පුරුෂ යකු හට පමණි. අන්‍යයන් මෙම පණිවුඩය නොසලකා හැරම වරදක් නොවේ.

ලෝකයේ පහල වී ඇති සියලු ආගම් සත්වයාගේ දුකට පිහිට වීම මුල්කොට ගෙන පහල වීයැයි කීම ප්‍රතික්ශේප කළ නොහැක්කකි. එහෙත් සෑම ආගමකම ඇති ඉගැන්වීම සත්ත්වයකු දුකින් මුදවාලිය හැකි දුක යනු කුමක්දැයි වටහාගත් ඉගැන්වීමක්දැයි විමසා දැන ආගම තීරණය කළ යුතුයැයි පැවසීම වරදක් නොවේ. උපන් සත්ත්වයාට ජරාව දුකකි. ඉදුරන් දුර්වල වීම, තමන් ඉෂ්ට යැයි ගෙන ප්‍රාර්ථනය කරන්නා වූ සතුටට බාධාවකි. ව්‍යාධිය හෙවත් ලෙඩ වීමද දුකකි. මරණයද දුකකි. ඒ දුකට හේතුවද සතුට කෙරෙහි ඇතිවන බාධාවය. ඉෂ්ට කාන්ත මනාප වින්දනයන් ලබමින් ප්‍රීතිවිය හැකි යෞවනය අහිමි වීමත් නිරෝගී බව නැති වීමත් ජීවිතය අහිමි වීමත් තරමේ දුකක් තවත් ඇද්ද ? බුදු දහමෙහි මෙසේ විග්‍රහකොට ඇත. දුක අන් ආගමකට එසේ නොවේයැයි පැවසිය හැකි නොවේ.

මේ කියන ලද දුක් කායික හා මානසික පීඩාවන්නේ ස්වභාවයෙන් අපකරා එන්නෝය. ඒ දුක් අකමැති අපි දුකින් මිදීම සොයා යන්නෙමු. තෘෂ්ණාවෙන් ගත් රූප වේදනා සඤ්ඤා සංඛාර විඥාන යන මේ පංච උපාදානස්කන්ධයෙහි හෙවත් සත්ත්වයා කෙරෙහි දුක හටගත්තේය. හේතු සහිතව හටගත්තේය. දුකට හේතුව නැතිකළ විට දුක නැති වන්නේයයි පවසන බුදු දහම දුකට හේතුව වනසාලිය යුතු ආකාරයද පෙන්වා දෙන්නේය. (බුදු දහම හදාරා ඉගෙනගත යුතුය.)

විශ්ව ක්‍රියාකාරත්වය හෙවත් ස්වභාවධර්මයේ බලපෑම මත මිනිසා කෙරෙහි සිදුවන බලපෑම ආදි මිනිසාට වටහාගත නොහැකි වීම පුදුමයක් නොවේ. දුකට සැපට දෙකටම බලපාන්නා වූ මේ විශ්ව ක්‍රියාකාරත්වය දේවත්වයට ආරෝපණය කිරම ඒ ආදි මිනිසා විසින් සිදුකරන ලද උපකල්පනයේ ප්‍රතිඵලයයි. දුකට භාජනය වන්නා වූ සත්ත්වයාගේ හට ගැනීමද නුවණ මිනිසාට ප්‍රශ්නයකි. සත්වෝත්පත්තිය පිලිබඳ වැටහීම නොලද ඒ මිනිසා ලෝකෝත්පත්තියක් සත්වෝ-ත්පත්තියක් දෙකම සර්වබලධාර දේවත්වයේ මැවිල්ලක් යැයි උපකල්පනය කළේය.

අද අප ජීවත් වන්නේ උපකල්පන යුගයේ නොවන බව ඔබට වැටහෙනවා නොවැ. මේ යුගය විමසීමෙන් හා විමසා පරයේෂණ කිරමෙන් ප්‍රත්‍යක්ෂ කොට නිගමනය කිරමේ යුගයයි. දෙවියන් විසින් ලෝකයත් සත්ත්වයන් මවන ලදැයි ප්‍රත්‍යක්ෂ කළ අයෙක් නැත. එය මුළුමනින්ම උපකල්පිත දෘෂ්ටියකි. උපකල්පනයෙන් ගත් ඒ දෘෂ්ටිය පිළිගැනීම සෘැකසටසදබ (ආගම) යන වචනය විග්‍රහ කරන ශබ්දකෝෂ විග්‍රහයන් පෙන්වා දී තිබේ. ඒ අනුව මෙය අපගේ විග්‍රහයක් නොව ලෝක සම්මත විග්‍රහයක් බව අපි ඔබට අවධාරණය කරනු කැමැත්තෙමු.

ලෝකය හා සත්ත්වයා පිළිබඳ බුදුරඳුන්ගේ දර්ශනය උපකල්පනය් නොවේ. බුද්ධිමය පරයේෂණය තුළ සිදු කළ ප්‍රත්‍යක්ෂයයි. ලෝකය හා සත්ත්වයා පිළිබඳ කළ අවබෝධය ඇති හෙයින් ම බුද්ධ නම් වේ. එහෙයින් බුදු රදුන්ගේ දර්ශනය පිළිගැනීම ලෝකය හා සත්ත්වයා පිළිබඳ සත්‍යය පිළිගැනීම වෙයි.

සාමාන්‍ය ජනයා "ලෝකය" ලෙසින් හඳුන්වන්නේ අපේ ඇස් කන් නාසාදීන්ට අරමුණු වන වර්ණ, සබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන ලෙසින් කියන ලද බාහිර ලෝකයයි. ඒ බාහිර ලෝකය කිසිවකු විසින් බව ලද්දක් නොව පඨවි ආපෝ, තේපෝ, වායෝ යන විශ්ව ශක්තිය දරන්නා වූ ශුද්ධ ධාතුන්ගේ ඇතිවමින් පවතිමින් නැතිවන නොසිද පවත්නා ක්‍රියාකාරත්වය මත සකස් වූවක් බව බුදුරජාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂණයෙන් දැන දේශනා කළහ. ඒ බුද වදන අද විද්‍යාඥයන් විසින් මනාව සනාථ කරණු ලැබීම බුදු දහමේ සත්‍යතාවය ලොවටම විදහා පාන්නකි.

සත්ත්වයාගේ හටගැනීමද බුදු රදුන් විසින් දේශනා කරන ලදහ. "තණ්හා ජනේති පුරිසං චිත්තමස් විබාවති" තෘෂ්ණාව සත්ත්වයා උපදවන්නේය. තෘෂ්ණා සහගත සිත ඔබ මොබ දුවයි. යනුවෙන් සත්ත්වයාගේ ඉපදෙමින් මැරෙමින් යන සංසාර ගමන බුදුදහම පැහැදිලි කර ඇත.

සත්ත්වයා දෙවියන් විසින් මවන ලදැයි දේවාගම් කීවද බුදුරදුන් පවසන්නේ සත්ත්වයා නාමයයි කියන ලදී. සතේක රූපයෙන් එකතුව නිසා හට ගත්තක් බවය.

මාතාපෙත්තික සම්භවය නිසා පඨවි ආපෝ තේජෝ වායෝ සංඛයාත රූප ධාතූන්ගෙන් සත්ත්ව රූපය හටගත් බව ධම්මික සූත්‍රයෙහි දී දේශනාකොට ඇත. එබැවින් රූපය මැවූ දෙවියෝ නම් මාපියෝම වෙති. බුදු රදුන් ලොව පහල වන විටදීත් සර්වබලධාරි බ්‍රහ්ම දෙවියා සත්ත්වයා හා ලෝකය මැවීයැයි යන උපකල්පනය විය. ඊශ්වර විශ්ණු නාමයන්ද මේ බ්‍රහ්ම දෙවියා සඳහාම කියැවේ. සත්ත්වයා මැව්වේ බ්‍රහ්ම නම් බ්‍රහ්ම යන අම්මා තාත්තා යැයි බ්‍රහ්මාති මාතාපිතරෝ යනුවෙන් බෙදා දෙනු වදාළහ.

පියාගේ ශුක්‍රාණුවේ සිත නොතිබිනි. මවගේ බීජාණුවේද සිත නොතිබිනි. එසේනම් ඒ ශුක්‍රාණු බීජාණු එකතුවට සිත කොයින් ආවේද ? ඒ සිත දෙවියන් විසින් දෙන ලද්දේද ?

සිත අරූපී ධර්මයකි. එය වේදනා, සඤ්ඤා, සංඛාරා විඤ්ඤාන යන සතර අරූප ධාතූන් නිසා හටගත්තේ වෙයි. ඇස්කන් නාසාදී ඉඳුරන්ගෙන් රූපාදී අරමුණු සඤ්ඤා ගෙන ඒ. සඤ්ඤා හැඳ නීම විඤ්ඤානයයි. සඤ්ඤා විඤ්ඤාණයේ එක්ව හටගන්නේ සුව දුක් වේදනා වින්දද තෘෂ්ණාව නිසා සිදුවේ. තෘෂ්ණා සහිතයාට චේතනා සහගත කර්ම හෙවත් සංස්කාරයන්ගේ හට ගැනීම වේ. යම් දිනෙක අධ්‍යාත්මික හා බාහිර ලෝකයන් පිළිබඳ අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලකෂණාව බෝධ ය ලැබ ඒ ලෝකය කෙරෙහි වූ තෘෂ්ණාව සිඳ හලේද එකල්හි තෘෂ්ණා සහගත කර්ම කෂය වීමෙන් දුක් රැස ඇති කිරමේ ප්‍රධාන හේතුව පස්කඳ රැස්කිරම නැවති එසේ පස්කඳ හට ගැන්වීම නවතාලීම නිර්වාණයයි.

තෘෂ්ණාව හේතුවෙන් සිතේ ලොභ දෝස මෝහ යන අකුසල චෛතසික පහල වේ. එකිනෙකාට දුක් ගෙන දෙන්නාවූ ඔවුනොවුන් ඇනකොටාගෙන මරාගන්නා වූ රට රාජ්‍යයන් විනාශ කරන්නා වූ පාපයන් මිනිසා විසින් සිදු කරනු ලබන්නේ මේ ලෝබ දෝස මෝහ සහගත වූ පාපී සිතුවිලි හේතුවෙනි. දෙවියන් මේ පවුකාර සිතුවිලි සහිත සිත මිනිසාට දී පව්කාර ලෝකයක් මැව්වා යැයි ඔබ පිළිගන්නේද ? නොදියුණු සිත ඇති මිනිසා සිය දුර්වල වූ සිතීමේ ශක්තිය හේතුවෙන් නොවිමසා කටයුතු කිරමෙන් ඔහු කෙරෙහි වූ පාපී බවම තහවුරු කරන්නේය.

මිනිසාට ආගමක් අවශ්‍ය වන්නේ දුෂ්ට වූ පාපී සිතුවිලි මිනිස් සිතෙන් ඉවත්කොට මිනිස් සිත පහන් කර සැනසිල්ල ලබාදීම සඳහාය. දෙවියන් වහන්සේ ඔබව බලාගන්නවා. ඔබට පිහිට වෙනවායි පැවසීම මිනිස් සිත මුලා කරවන්නකි. දෙවියන් වහන්සේ ලෝකය මැවීයැයි කීමම ලෝක බොරුවක් බව ක්‍රිස්තියානි ලෝකයේ බුද්ධිමත් ජනතාව එහෙළා පිළිගෙන ඇත. සුරාවෙන්, සූදුවෙන් මතින් බොරුවෙන් වංචාවෙන් සොර සිතින් ජීවත්වන කාමාපචාරයන්හි යෙදෙමින් දුෂ්ට මානසිකත්වය වර්ධනය කරගත්, සත්ව හිංසාව සදාචාරය පාපී මානසික තත්ත්වයන් දෙවියන් වහන්සේ විසින් ආරක්ෂා කරනු ලබන්නේ නම් ඒ දෙවියා, විනාශ කරදැමීම බුද්ධිමත් මිනිසාගේ පරම යුතුකම වේ.

බටහිර ක්‍රිස්තියානි ලෝකයේ බුද්ධිමත් ජනතාව බුදු දහමින් ලැබිය හැකි සැනැසිල්ල වටහාගෙන බෞද්ධ පිළිවෙත අගයමින් බුදු සසුන සොයා එයි. පාපයෙහි ගැලී ගත් ශ්‍රී ලංකාවේ බෞද්ධයෝ සිය මුග්ධ වූ දුගී බව නැතිකොට සැප ලබා දෙන්නට යැයි දෙවියන්ගෙන් ඉල්ලති. කුදු මහත් සියලු කටයුතු දෙවියන් ලවා ඉටුකරවා ගැනීමට සිතති. අවසානයේ දෙවියන්ගේ පිහිට පතා ලෝකයේ කිසිවෙකු හට ප්‍රතික්ෂේප කළ නොහැකි බුදුමග පාවාදී අන්‍යාගම් වැළැඳ ගනිති.

ස්වර්ගයේ පස් වලින් මිනිසා මවා මිනිසාගේ ඉල ඇටයෙන් ගැහැනිය මැවූ බව කිතු දහමත් මුස්ලිම් දහමත් පවසා ඇත. මිනිස් මොළය සෑදී ඇත්තේ පස්වලින් හෝ මැටි වලින් නොවේ නම් ආගමේ තිබුණා කියා මෙවන් කතා විශ්වාස කොට මිනිස් බුද්ධිය වර්ධනය කිරමට මාර්ගය පෙන්වා දෙන බුදු දහමට පා පහර දීමට හේතුවක් නැත.

සත්ව හිංසාවෙන් සත්ත්ව ඝාතනයෙන් වළකින්න. නොදුන්දේ ගැනීමෙන් වළකින්න. කාමාපචාරයෙන් වළකින්න. බොරුකීම් කේලාම් කීම් ආදියෙන් වළකින්න. සුරාවෙන් මතින් වළකින්න. එවිට ඔබේ බුද්ධිය වැඩෙන්නේය. උපයන දේ ආරක්ෂා වන්නේ බුද්ධිමත් ජීවිත පරිහරණය හේතුවෙන් සියලු සැපයට පැමිණෙන්නේය.

කිතු දහම බුදුදහමට වඩා සාර්ථක සහිත දහමක් වූවා නම් ශ්‍රී ලංකාව දේව රාජ්‍ය වීම බොහෝ කලකට ඉහතදී සිදු වී ඇත. අද අහිංසක දුප්පත් ජනතාවට ලාබ ලෝභයන්ගෙන් මුලාකොට ක්‍රිස්තියානයට හරවා ගන්නට උත්සහ ගන්නේ ක්‍රිස්තියානියේ ඇති නිසරු බවත් පහත් බව නිසා නොවේදැයි ඔබම සිතා බලන්න.

බුද්ධිමත් කිතු බැතිමතුනි සිතා බලනු මැනවි. ඔබේ පරපුරේ යම් අයෙක් සිදු කළ මහා පාවාදීම හේතුවෙන් අද ඔබ කිතු බැති මතෙකු වී සිටී. එසේත් නැත්නම් ඔබ විසින් ඒ පාවාදීම සිදුකොට ඇත. සදාචාරයේ දහම පාවාදීම පාපයකි. පාපය පාපියා නිරයට හෙලන්නේය. පින්වත පාපයෙන් මිදෙනු මැනවි. නැවතත් සදාචාරයේ දහම වූ බුදු දහමට පිවිසෙනු මැනවි. ඔබට ධර්මයේ ශාන්තිය වේවා.

***මීට සත්වයාගේ හිත සුව කැමති***
***ගංගොඩවිල සෝම හාමුදුරුවෝ***

සම්බුදුරදුන් දෙසා වදාල ශ්‍රී සද්ධර්මයට අපව යොමු කල

පිරිසිදු බුදුදහම මෙයයි වටහා දුන්

සිංහල බොදුනුවාගේ යුතුකම මෙයයි පහදදුන්

නිදහුන් සිංහල ජාතිය අවදිකල

හෙළය පුබුදු කල

දහම් ගඟ ඔබවහන්සේයි

හිමියනි
අපි පන්සිල් රකින්නෙමු

කුසල් රැස් කරන්නෙමු

දිවි දෙවැනි කොට සම්බුදු සසුන සුරකින්නෙමු ,

හෙළය සුරකින්නෙමු

# හෙළහඬ ශිෂ්‍ය සංගමය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය